මහජන ලැදියාවට (public interest) අදාළ වන දිවි තොර කරගැනීමේ සිදුවීම් කිහිපයක් පසුගිය කාල වකවානුව තුළ විටින් විට පුවත්පත් මඟින් වාර්තා කර තිබිණි. Ethics Eye අප විසින් එවැනි මහජන ලැදියාවට (public interest) අදාළ වන දිවි තොර කරගැනීමේ සිදුවීම් වාර්තා කිරීමේදී පවා හැකිතාක් ආචාර ධාර්මික වීමේත්, ප්‍රවේසම් සහගත වීමේත් වැදගත්කම සහ අවශ්‍යතාවය නිරන්තරයෙන්ම අවධාරණය කරන ලදී. උදාහරණයක් ලෙස ලංකාදීප (30/11) සහ දිනමිණ (1/12) යන පුවත්පත් වල පළවූ, වැලිකන්ද ප්‍රදේශයේ කාන්තාවක් දිවි තොර කරගැනීමේ සිදුවීම සම්බන්ධ පුවත් වාර්තාවන් ගත හැක.

මෙම පුවත් වාර්තාවන් සමග හදිසි උපකාරක අංක සඳහන් කර නොමැත. දිවි තොර කරගත් පුවතක් සමගින් හදිසි උපකාරක අංක සඳහන් කළේ නම්, දිවි තොර කරගැනීමේ නැඹුරුවකින් යුතු තවත් අයෙකු ඒ ඔස්සේ උපදේශන සහාය ලබාගැනීමට ඉඩ ඇත. ඒ ඔස්සේ තවත් ජීවිතයක් බේරා ගැනීමට අවකාශය ලැබෙනු ඇත.

එසේම, මෙම පුවත්පත් වල සහෝදර ඉංග්‍රීසි පුවත්පත් තුළ, මෙම දිවි තොර කරගැනීමට උත්සාහ කිරීම පිළිබඳ පුවත් වාර්තා වී නොතිබුණි.

උපකාරක අංකයක් පළ කරමු, ජීවිතයක් රැක ගනිමු!

හදිසි උපකාරක අංක:
CCCline - 1333
ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
ජාතික මානසික සෞඛ්‍ය ආයතනය - 1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවිඩ මාර්ගයෙන් සම්බන්ධ කර ගත හැක)

මූලාශ්‍ර:
https://www.imediaethics.org/the-ethics-of-reporting-on.../
https://ethics.journalists.org/.../mental-health-and.../ https://accountablejournalism.org/.../australia-standards...